ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
SLGURU.LK

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 13 | විෂයය Subject: නාට්‍ය හා රංග කලාව - I (57) | කාලය Time: පැය 01 |

නම : ..........................................................................................................

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයා ෂෂ කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- ❖ අමතර කියවීම් කාලය විනාඩි 10

(01) වාචික අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) වාචික අභිනයට අයත් වන්නේ සංවාද පමණි.
   (2) වාචික අභිනයෙන් තොර ප්‍රාසංගික කලාවක් පැවතිය නොහැක.
   (3) ජනාන්තික, අපවාරිත, ආත්ම ආදී භාෂණ විධි වාචික අභනියට අයත් නොවේ.
   (4) නාට්‍යධර්මී සම්ප්‍රදායේ දර්ශන පසුතල ආදිය මවා පාන්නේ වාචික අභිනයෙනි.
   (5) ලෝකධර්මී සම්ප්‍රදායේ වාචික අභිනයට වැදගත් තැනක් හිමි නොවේ. (...............)

(02) නාට්‍යයක් යනු ,
   (1) ආංගික අභිනය පමණක් භාවිත කෙරෙන නර්තනයකි.
   (2) රිද්මයක්, අර්ථයක් මනෝභාවයක් සහිත නර්තනයකි.
   (3) හුදු නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍රා වික්ෂේපය යි.
   (4) නෘත්ත යන්නට තවත් සමානාර්ථ දෙන පදයකි.
   (5) නාට්‍ය කලාවේ කිසිවිටෙක නොයෙදෙන්නෙකි. (...............)

(03) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) බටහිර රටවල ප්‍රචලිත බැලේ නාට්‍යයේ අනුකරණයකි.
   (2) පසුබිම් සංගීතය හා ගායනය වැදගත් නොවේ.
   (3) ප්‍රේමකුමාර එපිටවල, පණීභාරත, චිත්‍රසේන, වජිරා ආදීහු මුද්‍රා නාට්‍ය කලාවට දායකත්වය දැක්වූවෝය
   (4) ශ්‍රී ලාංකේය මුද්‍රානාට්‍ය නිෂ්පාදනය වූයේ චිත්‍රසේන හා වජිරා අතිනි.
   (5) මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය යනුවෙන්ද හැඳින්වේ (...............)

(04) අභිරූපණ ශිල්පියෙකුගේ කාර්ය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?
   (1) මම තෙලිතුඩ උපයෝගී කරගෙන මා අවට ඇති හිස් අවකාශය රූ රටාවෙන් අලංකාර කරමි.
   (2) මම වේදිකාව මත ප්‍රතිමාවක් මෙන් සිටගෙන ගායනා කරමි.
   (3) මම චතුර් අභිනය උපයෝගී කොටගෙන රූ රටා මවමි.
   (4) මම මා වටා ඇති අවකාශයේ අර්ථ විරහිත රූ රටා මවමින් සිටිමි.
   (5) මම මා අවට ඇති හිසි අවකාශයේ මාගේ ශාරීරික චලන උපයෝගී කරගනිමින් අර්ථාන්විත රටා මවමි. (...............)

(05) කොහොඹ කංකාරියේ ඇතුළත් නාට්‍යමය පෙළපාළි තුනක් අන්තර්ගත වරණය තෝරන්න.
   (1) සුවිසි විවරණ, ගුරුගේමාලාව, නයා යක්කම
   (2) සීතා යක්කම, අස්නෙ, මුවමල විදීම
   (3) දර්පණ යක්කම, ඌරා යක්කම, ගබඩා කොල්ලය
   (4) අත්‍ය බෙර අයිලෙ යැදීම, වැදි යක්කම
   (5) ඌරා යක්කම, හැන්දෑ දූරය, මාරාව (...............)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(06) සන්නියක්කුම යාගයේ රාංගභූමි අලංකරණ තුනකි
- (1) දෙකොණ විලක්කුව, සන්නියකුම් වීදිය, ඊගස
- (2) පිල්ලුම් වීදිය, ඊගස, අටමගල වීදිය
- (3) සන්නියකුම් වීදිය, මල්යහන, කපාල කුඩුව
- (4) මල් බලි, පිල්ලු වීදිය, දෙකොණ විලක්කු
- (5) අටමගල වීදිය, සන්නියකුම් වීදිය, නවමාලේ මල් බලිය (...............)

(07) ශ්‍රී ලංකාවේ මඩු ශාන්තිකර්ම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
- (1) මඩු ශාන්තිකර්ම වල දෙවියන්, යකුන් හා ග්‍රහයෝ පුද ලබති.
- (2) ප්‍රධාන වශයෙන් පූජාවට පාත්‍රවන්නේ නාථ දෙවියා ය.
- (3) ගම්මඩුවක් පැවැත්වීමේ මූලික අරමුණ වන්නේ කොඩිවින වලින් ආරක්ෂා වීමයි.
- (4) මඩු ශාන්ති කර්ම බහුලව දක්නට ලැබෙන්නේ උඩරට පළාතේ ය.
- (5) පූනාවකට වස් දොස් එක්කොට ගව හිසක ගසා පිදීම පූනා මඩුවකදී සිදුකෙරේ (...............)

(08) පහත සඳහන් ප්‍රකාශ වලින් සොකරි නාට්‍යයේ ශාන්තිකර්ම ලක්ෂණ හා සම්බන්ධ වැරදි වරණය තෝරන්න.
- (1) නාට්‍යධර්මී ශෛලිය, අනුරූපණය, පුරුෂයන් පමණක් රඟපෑම සරල වෙස්මුහුණු භාවිතය
- (2) පූජ්‍යාර්ථය අන්තර්ගත ගායනා පේවීම කතාවක් තිබීම, ගැටබෙරය භාවිතය.
- (3) අසභ්‍ය වචන භාවිතය, ගායනා අන්තර්ගතවීම, අනුරූපණය චරිත කිහිපයක් තිබීම.
- (4) යක්කම් හා පාලි අන්තර්ගතවීම යක් බෙරය භාවිතය, වෙස්මුහුණු භාවිතය හා වේදිකාවක් මත රඟපෑම.
- (5) පේවීමේ චාරිත්‍රය අනුගමනය කිරීම, පහන් පැලක් තිබීම, යක්කම් හා පාලිවලිනි උපුටාගත් අවස්ථා තිබීම. (...............)

(09) සිංහල නාඩගම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
- (1) පසුබිම් තිරයක් භාවිතය, නිශ්චිත පෙලක් තිබීම හා වෙස්මුහුණු භාවිතය
- (2) කරලිය නම් ස්ථානයේ රඟදක්වීම නිශ්චිත පෙළක් නොතිබීම, පසුබිම් තිරයක් භාවිතය
- (3) නාට්‍ය ධර්මී ශෛලිය අනුගමනය කිරීම පුරුෂයන් පමණක් රඟපෑම, වේදිකාවක රඟදක්වීම.
- (4) කර්ණාටක සංගීතය භාවිතය, නිශ්චිත පෙළක් නොතිබීම, හා ගායක පිරිසක් සිටීම.
- (5) පූර්ව රංගනයක් තිබීම, ස්ත්‍රීන් රංගනය දායකවීම, (...............)

(10)) කෝලම් නාටකයේ රංග ශෛලිය සම්බන්ධ නිවරුදි ප්‍රකාශය වන්නේ,
- (1) නිශ්චිත රංග ආකෘතියක් නොතිබීම, නිශ්චිත රංග පිටපතක් තිබීම, පූර්ව රංගයක් තිබීම.
- (2) නාට්‍යධර්මී ශෛලිය යොදාගැනීම, උඩරට ගැටබෙරය වාදනය කිරීම, ස්ථාවර පාත්‍රයන්ගේ පැමිණීම.
- (3) ගායක පිරිසක් සිටීම, වෙස්මුහුණු පැළඳීම, නැටුම් අන්තර්ගත නොවීම.
- (4) සමාජයේ චරිත උපහාසයට ලක් කිරීම, වෙස්මුහුණු පැළඳීම, නිශ්චිත ආකෘතියක් තිබීම.
- (5) නාට්‍යධර්මී ශෛලියට අනුගත වීම, වෙස්මුහුණු භාවිතා නොකිරීම, පූර්ව රංගයක් පැවතීම. (...............)

පහත දැක්වෙන පද ඇසුරින් 11 සිට 15 දක්ව ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

| | | |
|---|---|---|
| A - සී දොන් බස්තියන් | D - සිරිසේන විමලවීර | G - මෙහෙර්වන්ජි බලිවාලා |
| B - පේසාලේ | E - අන්තිම රාත්‍රී භෝජනය | H - කපටි ආරක්ෂකයා |
| C - රුක්මනී දේවි | F - රොඩී කෙල්ල | I - හැංගි හොරා |

(11) පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
- (1) A සහ E ය (2) I සහ G ය (3) F සහ H ය
- (4) D සහ C ය (5) B සහ E ය (...............)

(12) ටීටර් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
- (1) B සහ C ය (2) A සහ F ය (3) D සහ F ය
- (4) G සහ F ය (5) C සහ H ය (...............)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(13) මිහර්වා නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

(1) D සහ C ය (2) C සහ H ය (3) G සහ I ය

(4) F සහ D ය (5) A සහ F ය (...............)

(14) නූර්ති නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

(1) A සහ G ය (2) C සහ D ය (3) F සහ I ය

(4) B සහ H ය (5) D සහ F ය (...............)

(15) ආදි විශ්ව විද්‍යාල නාට්‍ය ඉතිහාසයේ නිර්මාණය වූ කෘතියකි.

(1) E (2) F (3) I (4) H (5) C (...............)

(16) මහාචාර්ය E.F.C ලුඩොවයික් දායකත්වය දැක්වූ නාට්‍ය සංගමය වන්නේ,

(1) ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල සමිතිය ය. (2) ද ප්ලේයර්ස් සංගමය ය

(3) විශ්ව විද්‍යාල කොලීජියේ නාට්‍ය සංගමය ය. (4) සිලෝන් ඩ්‍රාමා ලීග් ය

(5) ශේක්ස්පියර් සමාජය ය (...............)

(17) එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) දේශීය තොවිල් වල ආභාසය නාට්‍ය සඳහා පාදක කරගත්තේ නැත.

(2) කදාවලලු නාඩගම් සම්ප්‍රදායෙන් බැහැරව කළ නාට්‍යයකි.

(3) වෙස්සන්තර ගීතාංග නාටකයකි.

(4) පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය බෞද්ධ කතාවක් පාදක කොට ගත්තකි.

(5) ලෝම හංස, වෙල්ල වැහුම්, රත්තරං, මහසාර මෙතුමාගේ කෘතින්ය. (...............)

(18) පහත සඳහන් නාට්‍ය අතරින් සුගතපාල ද සිල්වාගේ නාට්‍යක් නොවන්නේ කුමක ද?

(1) බෝඩිංකාරයෝ (2) හරිම බඩු හයක් (3) මනරංජන වැඩ වර්ජන

(4) හිත හොඳ අම්මණ්ඩි (5) දුන්න දුනුගමුවේ (...............)

(19) ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාව සම්බන්ධ පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න

(1) නූතන දෙමළ වේදිකිවට දේශපාලන නාට්‍ය හඳුන්වාදෙන ලද්දේ කණපතිජිල්ලේ ය.

(2) චෞර්ණලිංගම් විසින් ''ලංකා සුබෝධ විලාස සභ' නමින් දෙමළ නාට්‍ය කණ්ඩායමක් සංවිධානය කරන ලදී.

(3) ලංකා විශ්ව විද්‍යාලය දෙමළ නාට්‍ය කලාව සම්බන්ධයෙන් දායකත්වයක් නොදැක්වීය.

(5) එස්. විද්‍යානන්දනි දෙමළ නාට්‍ය කලාවට මෙන්ම පොදු ශ්‍රීලාංකේය නාට්‍ය කලාවට සිය දායකත්වය ලබා දුනි. (...............)

(20) ''රාවනේසන්'' නාට්‍ය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කාන්තා චරිත පිරිමි විසින් රඟපාන ලදී.

(3) රාමායනය පදනම් කොට ගත්තද සීතාගේ චරිතය ඇතුළත් නොවීය.

(3) මුල්ම දෙමළ ස්වතන්ත්‍ර නාට්‍යයයි.

(4) වර්ෂ 1964 දී එස්. විද්‍යානන්දන් මෙම නාට්‍ය රචනා කළේ ය.

(5) සාම්ප්‍රදායික වඩමෝඩි ශෛලියේ ආභාසය ලබා ඇත. (...............)

පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - සන්ධිම | F - සමවකාර | K - රංග පීඨය |
| B - බූතයි | G - ව්‍යායෝම | L - වකුෂුගත |
| C - මත්ත වාරිනී | H - අතොශ | M - හෂිකගරී |
| D - ෂිතෙ | I - ව්‍යායෝග | N - වෙෂ්ටිත |
| E - නාටක | J - රංග ශීර්ෂය | O - ව කි |

(21) සංස්කෘත නාට්‍ය කලාව හා සම්බන්ධ රංග භාණ්ඩ වේ.

(1) C, F හා G ය (2) A, G හා N H (3) I, J හා N H

(4) E, G හා F ය (5) K, L හා J H (...............)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(22) නෝ නාට්‍ය රංග භූමිය හා සම්බන්ධ වේ.
(1) B, H හා M ය (2) G, M හා O ය (3) D, E හා H ය
(4) H, B හා L ය (5) A, D හා M ය (...............)

(23) කබුකි නාට්‍ය කලාව හා සම්බන්ධ චරිත වේ.
(1) B, D හා H ය (2) E, H හා L ය (3) D, L හා O ය
(4) G, L හා O ය (5) L, M හා O ය (...............)

(24) සංස්කෘත නාට්‍ය කලාවේ රංගභූමිය හා සම්බනධ වේ
(1) C, J හා K ය (2) F, G හා J ය (3) A, C හා I ය
(4) I, K හා N ය (5) E, G හා I ය (...............)

(25) සංස්කෘත නාට්‍ය කලාවේ දශ රූපකය හා සම්බනධ වේ
(1) A, C හා E ය (2) F, G හා I ය (3) G, K හා N ය
(4) E, F හා I ය (5) E, F හා G ය (...............)

(26) සංස්කෘත නාට්‍යයේ ''ප්‍රාප්ත්‍යාශා'' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පංච අර්ථෝපක්ෂේපයේන එකකි.
(2) සංස්කෘත නාට්‍යයේ සන්ධි වර්ග වර්ගයකි.
(3) නේතෘගේ අරමුණු ඉටුවේද නොවේද යන සාංකාව ප්‍රේක්ෂකයා තුළ හටගන්නා අවස්ථාවයි.
(4) නේතෘගේ බලාපොරොත්තුව ප්‍රෙක්‍ෂකයාට දැනගැනීමට සැලසෙන අවස්ථාවයි.
(5) පංචවිධ අර්ථප්‍රකෘති වලින් එකකි. (...............)

(27) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ඉදිරිපත් කළ රස භාව සංකල්පය පිළිබඳ අදහස් පළකල තවත් විචාරකයින් දෙදෙනෙකි,
(1) භට්ටනායක සහ අභිනවගුප්ත ය (2) භාස සහ කාලිදාස ය
(3) අශ්වඝෝෂ හිමි සහ භට්ටනායක ය (4) භවභූති හා විශාඛදත්ත ය
(5) හර්ශදේව සහ භවභූති ය. (...............)

(28) අභිඥාන ශාකුන්තලයේ විදූෂක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දුෂ්‍යන්ත පෙනී සිටින සෑම අංකයකම පෙනී සිටී.
(2) හැඳින්වෙන්නේ මෛත්‍රිය යන නාමයෙනි.
(3) දෙවන අංකය අවසානයේ හස්තිනාපුරය බලා යන්නේ බලවත් නොකැමැත්තෙනි.
(4) කාලිදාසගේ සෙසු නාට්‍ය වලට වඩා විශාලතම කාර්යභාරයක් ඉටු කරයි.
(5) දෙවන අංකය ආරම්භයේ දී පෙනී සිටින්නේ කළකිරුණු ස්වභාවයෙනි (...............)

(29) සකුන්තලා හයස්තිනාපුරය බලා පිටත්වීම සූදානම් වන අවස්ථාවේ ඇයට ආභරණ ලැබුණේ,
(1) කාශ්‍යප ඍෂිගෙන් ය (2) වනස්පතීන්ගෙන් ය
(3) මේනකාගෙන් ය (4) ගෞතමීගෙන් ය.
(5) අනසූයාගෙන් ය. (...............)

(30) ''ගලින් ගල ගටාලා - අන්ධකාරේ අතීතේ, ගිනි පුපුරු මැවූ ඒ....'' කුවේණි නාට්‍යයේ එන ගීතය ගයන්නේ කවරෙක් ද?
(1) පූරක (2) දඩයක්කරු (3) ගායක කණ්ඩායම
(4) ජීවහත්ත (5) දිසාල (...............)

(31) කුවේණි නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යධර්මී ශෛලියට දෙබස් රචනා වී ඇත.
(2) නාට්‍යතුළ කුවේණි පිළිබඳ සාම්ප්‍රදායික දෘෂ්ටියක් මතු කරයි.
(3) නාට්‍යධර්මී හා ලෝකධර්මී ලක්ෂණ අන්තර්ගතය.
(4) කුවේණියට ප්‍රබල චරිත නිරූපණයක් ලැබී නැත.
(5) වේදිකා පසුතල හා රංගෝපකරණ භාවිතා නොවේ. (...............)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ප්‍රශ්න අංක 32 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා සංකල්ප / නාම පහ බැගින් දී ඇත. ඒ අතර සෙසු පද හා නොගැළපෙන පදය බැගින් තෝරාගෙන එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

(32) (1) වඩමෝඩි (2) තෙන්මෝඩි (3) කලරි
(4) මකීඩ් (5) වසන්තන් කුත්තු (..............)

(33) (1) බහිනකලාව (2) හැංගිහොරා (3) වළහැඩියා
(4) මැනේජර් (5) මේජර් බාර්බරා (..............)

(34) (1) විහාර අස්නය (2) තල්පත (3) දේවදූතයා
(4) නාගසේන හිමි (5) සති පිරිත (..............)

(35) (1) පිටිපන (2) පමුණුගම (3) දූව
(4) කටුනේරිය (5) ජා ඇල (..............)

(36) (1) බ්‍රම්පෝට් (2) ඉයුජින් (3) රොලීනා
(4) බැලසන්ත (5) ඇහැලේ පොල (..............)

(37) (1) පුත්‍ර සමාගම (2) අන්දරේලා (3) සඳගිර
(4) කනේරුමල (5) මායාදේවි (..............)

(38) (1) තාරාවෝ ඉගිලෙති (2) කැලණි පාලම (3) ධවල භීෂණ
(4) වෙල්ලමැහුම් (5) කොරා සහ අන්ධයා (..............)

(39) (1) චන්ද්‍රවතී සමඟ රාත්‍රියක් (2) වැලන්ටයින් එනකං (3) දුවන උන් දෙන්නෙක්
(4) ගෝඩෝ එනකං (5) කිරි අම්මාගේ අවතාරය (..............)

(40) (1) නට් ක්‍රැකර් (2) ස්ලීපිං බියුටි (3) හංස විල
(4) රෝමියෝ ජුලියට් (5) නල දමයන්ති (..............)

SLGURU.LK
For Educational Purpose Only

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone SLGURU.LK

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 13 | විෂයය Subject: නාට්‍ය හා රංග කලාව - I (57) | කාලය Time: පැය 02 |

- A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගිනි තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- අමතර කියවීම් කාලය විනාඩි 10

## A කොටස

(01) (i) කුවේණි වේදිකා නාට්‍යයට මූලාශ්‍ර වූ පුවත කෙටියෙන් ලියන්න. **(ලකුණු 3)**

(ii) කුවේණි නාට්‍යයේ ''දඩයක්කරුගේ'' චරිතය ප්‍රේක්ෂකයාගේ පාර්ශවය නියෝජනය කරයි'' මෙම කියමන උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 5)**

(iii) කුවේණිය යනු ''සදාතනව දුක්පීඩා, නින්දා අපහාස ආදී අසාධාරණයට ලක්වන කාන්තාව නියෝජනය කෙරෙන සංකේතාත්මක නාමයකි.'' මේ කියමන විවරණය කරන්න. **(ලකුණු 7)**

(02) (i) සංස්කෘත නාට්‍යකලාවේ ප්‍රභවය පිළිබඳ මත දෙකක් සැකෙවින් දක්වන්න. **(ලකුණු 4)**

(ii) සංස්කෘත නාට්‍යයේ කතාවස්තුවේ ප්‍රධාන කොටස් දෙක නම් කර ඊට අදාළ අර්ථප්‍රකෘති නම් කරන්න **(ලකුණු 5)**

(iii) අභිඥානශාකුන්තලය ඇසුරින් අර්ථ ප්‍රකෘති 4ක් විවරණය කරන්න. **(ලකුණු 6)**

(03) (i) අභිඥාන ශාකන්තලය හා කුවේණි නාට්‍ය දෙකෙහි රචකයන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. **(ලකුණු 4)**

(ii) පුරා කතාව හා අභිඥාන ශාකුන්තලය නාටකය අතර ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න. **(ලකුණු 5)**

(iii) තමන් මුහුණදුන් ගැටුම්කාරී අවස්ථාවට සකුන්තලා හා නූතන කුවේණිය මුහුණ දුන් ආකාරය විද්‍යාර්ථයෙකු ලෙස ඔබට වැදගත් වන්නේ කෙසේදැයි ඔබේ ආකල්පය පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

## B කොටස

(04) (i) නාඩගම් රංගභූමිය ඇඳ රූප සටහන විස්තර කරන්න. **(ලකුණු 3)**

(ii) නාඩගම් ප්‍රභවය පිළිබඳ මත දෙකක් සාකච්ඡා කරන්න. **(ලකුණු 5)**

(iii) ගැමි නාටක විලින් ඔබ්බට ගිය බොහෝ ලක්ෂණ නාඩගම් තුළ ගැබ්ව ඇති කරුණු දක්වමින් ඉහත කියමන සනාථ කරන්න. **(ලකුණු 7)**

(05) (i) ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම වලින් පුද ලබන යක්ෂ හා දේව සංකල්ප දෙක බැගින් ලියන්න. **(ලකුණු 3)**

(ii) ලංකාවේ ප්‍රචලිත යක් තොවිල් අතරින් එකක නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. **(ලකුණු 5)**

(iii) ලංකාවේ ප්‍රචලිත දේව තොවිල් එකක් තෝරාගෙන එහි රඟමඩුලු සැරසිලනි සහ වේෂභූෂණය පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදෙන්න. **(ලකුණු 7)**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(06) (i) 1956 හා ඉන් පසුව දේශීය වේදිකාවේ රඟ දැක්වූ නාට්‍යධර්මී නාට්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. **(ලකුණු 4)**

(ii) එදිරවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය වලට ජපන් සාම්ප්‍රදායික නාට්‍ය කලාව බලපා ඇති ආකාරය පිළිබඳ කෙටි විවරණයක යෙදෙන්න. **(ලකුණු 5)**

(iii) නාට්‍යධර්මී නාට්‍ය සිංහල නාට්‍ය කලාවේ අභිවෘද්ධියට කෙසේ බලපා තිබේදැයි උදාහරණ සපයමින් සාකච්චා කරන්න. **(ලකුණු 6)**

SLGURU.LK
For Educational Purpose Only

"Live as if you were to die tomorrow. Learn as if you were to live forever." — Mahatma Gandhi

Visit SLGURU.LK to download papers and notes.

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
SLGURU.LK
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | නාට්‍ය හා රංග කලාව - II (57) | කාලය Time | පැය 01 |

නම : ......................................................................................................

එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න

## I කොටස

(01) ''නාට්‍ය යනු ජීවිතයේ පිටපතකි, සිරිත් විරිත් වල කැඩපතකි'' යනුවෙන් ප්‍රකාශ කළේ

(1) භරතමුණි (2) ධනංජය (3) ඇලඩයිස් නිකොලල්
(4) විලියම් ශේක්ස්පියර් (5) ඇරිස්ටෝටල්

(..................)

(02) ''වේදිකාවේදී මැවෙන දෘෂ්ටිගෝචර භාවය ප්‍රේක්ෂාව ලෙස දැක්වූයේ,

(1) භරතමුණි (2) බර්නාඩ් ෂෝ (3) විලියම් ශේක්ස්පියර්
(4) ඇරිස්ටෝටල් (5) සැමුවෙල් බෙකට්

(..................)

(03) ''ගැටුමක් නැති තැන නාට්‍යක් නැත'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(1) ධනංජය පඬිවරයා (2) ඇරිස්ටෝටල් (3) භරතමුණි
(4) ජෝර්ජ් බර්නාඩ් ෂෝ (5) විලියම් ෂේක්ෂ්පියර්

(..................)

(04) බැලේ, මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය, ඔපෙරා, යන කලාවන් පොදුවේ වර්ගකල හැක්කේ,

(1) සතර අභිනය මත ජීවය ලබන කලා වශයෙනි.
(2) ආනුශංගික කලා ප්‍රභේද වශයෙනි.
(3) පෙරදිග ප්‍රාසාංගික කලා මාධ්‍යන් වශයෙනි.
(4) අපරදිග ප්‍රාසංගික කලා මාධ්‍යන් වශයෙනි
(5) නෘත්‍යමය ලක්ෂණ ප්‍රකට කරන කලා මාධ්‍යයන් වශයෙනි

(..................)

(05) ලලිත කලාව ව්‍යවහාරික කලාවෙන් වෙනස්වීමට බලපාන ප්‍රධානතම සාධකය වන්නේ,

(1) ව්‍යවහාරික කලාව තුළ ලගන්නා සුළු ස්වභාවයක් පැවතීම ය.
(2) මිනිස් විඥානයට ආමන්ත්‍රණය කිරීම නිසාවෙනි.
(3) ප්‍රාසාංගික ස්වභාවය තුළ පවතින විෂමතාවය යි.
(4) ව්‍යාපාරික අරමුණු ඔස්සේ ප්‍රභවය නොවීම යි.
(5) ලලිතකලාව ග්‍රාම්‍ය සහ ව්‍යවහාරික කලාව නාගරික වීම ය

(..................)

(06) බාහිර ලක්ෂණ සලකා කලාව වර්ගීකරණය වන්නේ,

(1) ගැමිකලා, ලලිත කලා, ජනප්‍රිය කලා වශයෙනි
(2) ව්‍යවහාරික කලා, ලලිත කලා, ප්‍රාකෘතික කලා වශයෙනි.
(3) ප්‍රාසාංගික කලා, ගැමි කලා, ලලිත කලා වශයෙනි
(4) ලලිත කලා, ජන කලා, ව්‍යවහාරික කලා වශයෙනි
(5) ගැමිකලා, ව්‍යවහාරික කලා, ලලිත කලා වශයෙනි.

(..................)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(07) නාට්‍ය අධ්‍යක්ෂ යනු,

(1) පෘථුල අත්දැකීම්වලින් යුතු නාට්‍යයේ හා පෙළෙහි ආඥාදායකයා
(2) නාට්‍යයට මුදල් යොදවන්නාය
(3) නළුවන් මෙහෙයවන්නාය.
(4) නාට්‍ය පෙළ නලු නිලියන් හා අනුශංගික ශිල්පීන් හා එක්ව රංගයක් බවට පෙරළන්නාය.
(5) නාට්‍ය පෙළ රංගයක් බවට පත්කරන නලු නිලියන් හා අනුශංගික ශිල්පීන් ය. (..................)

(08) නාට්‍ය කලාවේදී අර්ථපති වශයෙන් සලකනු ලබන්නේ,

(1) නාට්‍ය නිෂ්පාදනය සඳහා මුදල් වැය කරනු ලබන්නාය.
(2) නාට්‍ය පෙළ රචනය කරන්නාය.
(3) වේදිකා පරිපාලකවරයාය.
(4) නාට්‍ය සඳහා අනුශංගික ශිල්පීන් රැස් කරන්නාය.
(5) නළුවරණය සිදුකරන්නායත (..................)

(09) ප්‍රාසාංගික කලාවන් අතර වඩාත් පුළුල් වූ නිරූපණ කලාව වන්නේ,

(1) වේදිකා නාට්‍ය (2) සිනමා කලාව (3) සංගීත ප්‍රසංග
(4) බැලේ නාට්‍ය (5) නර්තන ප්‍රසංග (..................)

(10) පුළුල් කෝණයකින් ආලෝක ධාරාවක් පතිත කිරීමට උපයෝගී කරගනු ලබන පහන් වර්ගය වන්නේ,

(1) වර්ණ චක්‍රය (2) යොමු පහන (3) ධාරා පහන
(4) පාර ජම්බුල පහන (5) ආලෝක බුබුළු වැට (..................)

(11) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය රඟදක්වන ලද්දේ,

(1) ප්‍රොසීනියම් හා ඒප්‍රණාකාර වේදිකාව.
(2) ඕර්කිස්ට්‍රා නම් ස්ථානයේ
(3) මණ්ඩප වේදිකා, සංදර්ශන රථ සහ ප්ලැටියා වේදිකා වල
(4) විකෘෂ්ට සහ චතුරශ්‍ර වේදිකා තුළ
(5) කේවියා, ආරුක්කු සහ මණ්ඩප වේදිකා තුළ (..................)

(12) සදුපදේශ නාට්‍යයක් වන්නේ,

(1) සකල ජන (2) වන එඬේරා (3) ජීවිත ගර්වය
(4) උට්ඨාන වීර්යයේ මාලිගය (5) සමාජයේ කුළුණු (..................)

(13) එළිසබතීන වේදිකා ස්වරූපය (හැඩය) කෙබඳු ද?

(1) සමචතුරස්‍රාකාර (2) වෘත්තාකාර (3) ඒප්‍රනාකාරය
(4) සෘජුකෝණාස්‍රාකාර (5) ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව (..................)

(14) ශේක්ස්පියර්ගේ නාට්‍ය වේදිකාවේ භාවිතා කළ රහස් දොරටු වැනි උපක්‍රම හා අවතාර, ජේනකාරියන් වැනි චරිත නිර්මාණය සඳහා බලපා ඇත්තේ,

(1) එලිසබතීනියානු යුගය (2) මධ්‍යකාලීන යුගය (3) රෝම යුගය
(4) ග්‍රීක යුගය (5) ජැකෝබියන් යුගය (..................)




(15) මෙම වේදිකාව අයත්වන නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

(1) එලිසබතීන (2) රෝම නාට්‍ය (3) සංස්කෘත නාට්‍ය
(4) ග්‍රීක නාට්‍ය (5) මධ්‍යකාලීන නාට්‍ය කලාවට ය (..................)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(16) මෙහි C අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) පැරඩෝස් (2) එපිඩෝස් (3) ස්ටැෂිමෝන්
(4) ස්කීනය (5) ඔර්කිස්ට්‍රාව (..................)

(17) මෙහි මේකිස් නමින් හඳුන්වන අංගය නියෝජනය වන්නේ,
(1) A (2) B (3) C (4) D (5) E (..................)

(18) ග්‍රීක පැරණි කොමඩි නාට්‍යයේ මූලිකයා ලෙස සැලකෙන්නේ,
(1) ඇරිස්ටෝටල් (2) යුරිපිඩීස් (3) ඇරිස්ටොෆනීස්
(4) සොෆොක්ලීස් (5) මිනාන්ඩර් ය (..................)

(19) "අහෝ දෙවියනි දැන් සියල්ල හෙළිවෙලා ආලෝකය අවසාන වතාවට ඉඩදෙනු මැන ඔබ දෙස බලන්න"
ඊඩිපස් නාට්‍යයේ කතා නායකයා අත්විඳින මෙම අවස්ථාව කතා වින්‍යාසයට අනුව
(1) ආකුලීකරනය (2) ප්‍රත්‍යවර්ථන අවස්ථාව (3) අනාවරණ අවස්ථාව
(4) ප්‍රත්‍යාභිඥාන අවස්ථාව (5) කැතැසීස්කරණය (..................)

(20) ග්‍රීක නාට්‍ය සාහිත්‍යයේ සමකාලීන සිද්ධියක් අන්තර්ගත කරගත් එකම ශෝකාන්තය
(1) මීඩියා නාට්‍ය (2) ඊඩිපස් රජ (3) පර්සියන්වරු
(4) සිටුවරු නාට්‍යය (5) ඇන්ටිගනී නාට්‍ය (..................)

පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - පර්සිකයෝ
B - මීඩියා
C - මිලිටොස් ලුනටනය
D - ඊඩිපස් රජ
E - ඇල්කෙස්ටිස්
F - ෆිනීසීය ස්ත්‍රීහු
G - ට්‍රෝජ කාන්තාවෝ
H - බොයිෆරෝයි
I - අයියස්
J - තෙස්පිසියන් වරු

(21) පුරාකතා මත පදනම් වූ නාට්‍ය අයත් වරණය වන්නේ,
(1) BDG (2) DEG (3) HLS (4) DFJ (5) DFI (..................)

(22) යුරිපිඩිස්ගේ වේදාන්ත නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) BEG (2) GFI (3) EGI (4) GHI (5) HIJ (..................)

(23) කුවේණි නාට්‍ය කතා පුවත හා සමාන සබඳතාවයක් දක්වන්නේ,
(1) A (2) B (3) C (4) D (5) E (..................)

(24) ෆ්‍රූනිබොස්ගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ,
(1) A (2) B (3) C (4) D (5) E (..................)

(25) අනුපිළිවෙළින් ගත් කල ඊස්කිලස් සොෆෝක්ලීස් හා යුරිපීඩීසගේ නිර්මාණ ඇතුළත් වරණය වන්නේ,
(1) HDB (2) BDI (3) FDB (4) HAE (5) BEG (..................)

26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා පහත තොරතුරු පදනම් කරගන්න.

A - විලියම් ශේක්ස්පියර්
B - හෙන්රික් ඉබ්සන්
C - බර්ටෝල් බ්‍රෙෂ්ට්
D - සැමුවෙල් බෙකට්
E - මෙයර් හෝල්ඩ්
F - ඇන්ටන් චෙකොෆ්
G - ක්‍රිස්ටෝපර් මාලෝ
H - ස්ටැනිස් ලැවෝස්කි
I - හැරල් පින්ටර්
J - අර්වින් පිස්කැටර්
K - තෝමස් කයිඩ්
L - ටෙනිසි විලියම්
M - ඉයුජින් අයනෙස්කෝ
N - සැක්සේ මෙයිනිංස්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(26) එලිසබතීන නාට්‍ය යුගය නියෝජනය කළ නාට්‍ය කරුවන් වන්නේ,
(1) DGK (2) AGK (3) IKN (4) EJL (5) AEN

(..................)

(27) යථාර්තවාදී රංග රීතිය අනුගමනය කල නාට්‍ය කරු වන්නේ,
(1) BEN (2) FIL (3) BFL (4) DFI (5) EFN

(..................)

(28) අභූතරූපී නාට්‍ය රීතිය තුළ එල්බගත් නාට්‍ය කරුවන් වන්නේ,
(1) CDG (2) DIM (3) DIC (4) FIN (5) FLM

(..................)

(29) රංග රීතීන් පිළිබඳව විශේෂ පර්යේෂණයන් සිදුකල නාට්‍ය කරුවන් වන්නේ,
(1) BFH (2) EHM (3) FJN (4) EIM (5) DGH

(..................)

(30) ආඛ්‍යාන රංගරීතිය හා සම්බන්ධ නාට්‍ය කරුවන් වන්නේ,
(1) DM (2) GI (3) CD (4) CJ (5) EJ

(..................)

31 සිට 35 දක්වා දී ඇති තොරතුරු අතර නොගැළපෙන වරණය තෝරන්න.

(31) (1) ධාර පහන (2) ස්ට්‍රෝබ් පහන (3) වර්ණ චක්‍රය
(4) අල්ට්‍රාවයලට් පහන (5) ස්ට්‍රිප් ලාම්පු (..................)

(32) (1) ප්‍රේක්ෂාලය (2) ඕර්කෙස්ට්‍රා (3) ස්කිනී
(4) පැරඩෝස් (5) අරීනා (..................)

(33) (1) යෝර්ක් (2) ප්ලැටීයා (3) චෙස්ටර්
(4) කවුන්ට් (5) ටවුන්ලි (..................)

(34) (1) සාමය (2) කුරුල්ලෝ (3) ප්ලුටස්
(4) ලයිසිස්ට්‍රා (5) ඉලෙක්ට්‍රා (..................)

(35) (1) ලියරජ (2) මැක්බත් (3) හැම්ලට්
(4) ටෙම්පස්ට් (5) කොරියොලනස් (..................)

වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(36) ලායුස් රජුගේ ඝාතනයට හේතුව සෙවීම ප්‍රමාද වීමට ක්‍රියොන් දක්වන හේතුව වන්නේ,
(1) තීබ දේශයෙන් පිටතදී මරණය සිදුවීම.
(2) ඩෙල්ෆ් දෙවිමැදුරෙන් දේව වාක්‍යක් නොලැබීම.
(3) ඊඩිපස් රාජ්‍යත්වයට පත්වීම.
(4) මන්ත්‍රකාරියන්ගෙන් එල්ලවූ උවදුරු
(5) ඇසින් දුටු සාක්ෂියක් නොමැතිවීම (..................)

(37) රොමැන්ටික් නාට්‍ය කලාවට අදාල නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ස්වභාව සෞන්දර්ය අදාරය වැනි තේමා පාදක නොවීම.
(2) භාවයට වඩා බුද්ධියට ප්‍රමුඛස්ථානයක් ලබාදීම.
(3) හෙන්රි ඉබ්සන්ගේ ද ගෝජට් රොමැන්ටික් නාට්‍යයකි.
(4) මෙය 18 වන සියවසේ ආරම්භ වූවකි.
(5) එව්ගිනි ෂ්වාස්ගේ ද ඩ්‍රැගන් රොමැන්ටික් නාට්‍යයකි (..................)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(38) නූතන අධ්‍යක්ෂ භූමිකාව ප්‍රථම වරට ඉටුකල සැක්සේ මෙයිනිජන් කුමන ජාතිකයෙක් ද?
(1) ඇමරිකානු (2) ජර්මානු (3) ඉතාලි
(4) ඉංග්‍රීසි (5) ප්‍රංශ (..................)

(39) හෙල්ම නෝරා අමතන විට ''පුංචි'' යන විශේෂණ පදයේ යෙදීමේ අර්ථය වන්නේ
(1) නෝරා පිළිබඳ හෙල්මගේ ඇති අවතක්සේරුවයි.
(2) නෝරාව හුරතලෙන් රැක බලාගතයුතු වීමයි.
(3) ඔවුන් දෙදෙනාගේ විවාහ ජීවිතය තුල ගොඩනැගුන ආදරය නිසාය
(4) ඔවුන් දෙදෙනා අතර ඇති වයස් පරතරයයි.
(5) තමන්ට වඩා නෝරාව සතුටින් ප්‍රීතියෙන් තබාගත යුතු බැවිනි. (..................)

(40) ජුලයස් සීසර් නාට්‍යයේ තුන්වන අංකයේ පළමු දර්ශනයේ, (1) සීසස් පෙත්සම ලබාදීමට පැමිණෙන්නේ,
(1) පේන කියන්නා (2) ඇටිම්ඩෝසේ (3) ඩෙසියස්
(4) ඔටියලස් (5) සින්නා (..................)

SLGURU.LK
For Educational Purpose Only

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
SLGURU.LK

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade: 13 | විෂයය / Subject: නාට්‍ය හා රංග කලාව - II (57) | කාලය / Time: පැය 02 |

නම : ........................................................................................................

## II කොටස

A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගිනි තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

(01) (i) මධ්‍යකාලීන යුගයේ ජනවන්දනා නාට්‍ය කලාව බිහිවූ අයුරු කෙටියෙන් දක්වන්න.

(ii) ජන වන්දනා නාට්‍ය ප්‍රභේද පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

(iii) ජනවන්දනා නාට්‍ය කලාව සහ ශේක්ස්පියර් නාට්‍ය කලාව අතර ඇති සබඳතාවය පැහැදිලි කරන්න.

(02) (i) නාට්‍ය විචාරය යනු කුමක් ද?

(ii) නාට්‍ය විචාරකයකු සතු ගුණාංග සහ කුසලතා කෙටියෙන් දක්වන්න

(iii) ධනාත්මක නාට්‍ය විචාරය නාට්‍ය කලාවේ උන්නතියට කෙසේ බලපාන්නේදැයි සාකච්ඡා කරන්න.

(03) (i) අසම්මත නාට්‍ය රකැවන් දෙදෙනෙකු සහ ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් දක්වන්න.

(ii) අභූතරූපි නාට්‍ය කලාව බිහිවීමට බලපෑ හේතුන් හා සමාජ පසුබිම පැහැදිලි කරන්න.

(iii) මෙම රංග රීතිය සතු ලක්ෂණ නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

### B කොටස

(04) (i) ජුලියස් සීසර් ඓතිහාසික මෙන්ම දේශපාලන නාට්‍යයකි. කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) ''බෲටස් යනු යහපත් රොමානුවෙකි'' සහේතුව සනාථ කරන්න.

(iii) මෙම නාට්‍යයේ කූටප්‍රාප්ති අවස්ථා නාට්‍ය සාර්ථකත්වයට කෙසේ බලපෑවේදැයි සාකච්ඡා කරන්න.

(05) (i) රූකඩ ගෙදර නාට්‍යයේ කුටුම්බය බිඳවැටීමට බලපෑ සාධක 4ක් දක්වන්න.

(ii) රූකඩ ගෙදර නාට්‍යයේ නිරූපිත ගැටුම සාකච්ඡා කිරීමට ඉබ්සන් යොදාගෙන ඇති රංග රීතියේ උචිත අනුචිත බව සාකච්ඡා කරන්න.

(iii) ස්වාමි භක්තිය සහා දරු සෙනෙහස හමුවේ පෙරදිග සහ අපරදිග කාන්තාවගේ ස්වභාවය රූකඩගෙදර සහ වෙනත් ඕනෑම නාටයක් තෝරාගනිමින් විචාරය කරන්න.

(06) (i) සම්භාව්‍ය ග්‍රීක ශෝකාන්ත නාට්‍ය කලාව පසුබෑමට ලක්වූයේ යුරිපිඩීස්ගේ කාලයේ ය. එයට බලපෑ සාධක 2ක් දක්වන්න.

(ii) කොමඩි නාට්‍යයේ වර්ධනය සඳහා ඇරිස්ටෝෆානිස්ගේ දායකත්වය විග්‍රහ කරන්න.

(iii) වඩාත්ම පරිනත වූ ශෝකාන්ත නාට්‍ය ලෙස ඊඩියස් ගේ නාට්‍ය සැලකිය හැකිය. ඊට බලපානු ලබන සාධක මොනවාදැයි නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

“Live as if you were to die tomorrow. Learn as if you were to live forever.” — Mahatma Gandhi

Visit SLGURU.LK to download papers and notes.